**කලාප අධ්‍යාපන කාර්යාලය - මතුගම**

**දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2019**

**Second Term Test - Grade 13 - 2019**

විභාග අංකය ..................

# බෞද්ධ ශිෂ්ටාචාරය I

කාලය පැය දෙකයි.

වැදගත්
- ★ සියලු ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- ★ 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට 1,2,3,4,5 යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුරු තෝරා එය සලකුණු කරන්න.

01 බ්‍රාහ්මණ දහම නිර්මාණවාදී දහමක් ලෙස හඳුන්වාදී ඇති අතර මහා බ්‍රහ්මයා 'විශ්වය නිර්මාණය කරන ලද පුද්ගලයා'' යන අදහස ගෙන දෙයි. එබැවින් ඔහු

i සර්වදර්ශි නම් වෙයි ii සර්වතෝභද්‍ර නම්ෙ වයි iii විශ්වකතෘ නම් වෙයි
iv සර්වඥ නම් වෙයි v සර්ව වාග් පථාතික නම් වෙයි.

02 බ්‍රාහ්මණ සංස්කෘතියට අනුව බ්‍රහ්මචාරී ආශ්‍රම ධර්මයට අනිවාර්ය වූවක් වන්නේ

i තවුස් දම් රැකීම ii විවාහ වීම iii දන් දීම
iv වේදය හැදෑරීම v රැකියාවක නිරත වීම

03 බ්‍රාහ්මණ ඉගැන්වීම්වලට අනුව වේද අධ්‍යාපනය, දානය, යාග කිරීම, පශු පාලනය ආදී කාර්යයන් සිදු කිරීමට නිර්දේශ කර තිබුනේ

i බ්‍රාහ්මණ වර්ණයට ය ii ක්ෂත්‍රිය වර්ණයට ය iii වෛශ්‍ය වර්ණයට ය
iv ශුද්‍ර වර්ණයට ය v කුලීන වර්ණත්‍රයට ය

04 ''වීටෙක ආර්යයා දාසයෙක් ද, තවත් වරෙක දාසයා ආර්යයෙක් ද විය හැකිය. පාලකයා පරදවා වෙනත් අයෙකු රජ වූවිට පාලකයා පාලිතයා බවට පත් වේ'' යනාදී වශයෙන් අස්සලායන සූත්‍රයේ සඳහන් මෙම දේශනාව තුළින් බුදුරජාණන් වහන්සේ ප්‍රකට කිරීමට උත්සහ කළේ.

i වර්ණ භේදයෙහි පවත්නා නිස්සාරණත්වයයි ii වේදයේ පවත්නා නිස්සාරත්වයයි
iii ආශ්‍රම ධර්ම වල පවත්නා නිස්සාරත්වයයි iv යාගයේ පවත්නා නිස්සාරත්වයයි
v ආපද් ධර්ම වල පවත්නා නිස්සාරත්වයයි.

05 ස්වාමියා මළ පසු භාර්යාව ජීවත් වන්නේ නම් ඇය වාසය කළ යුත්තේ කිළිටි වස්ත්‍ර හැඳ රසවත් ආහාර පානාදියෙන් වැළකී කිසිදු ආභරණයක් නොපැළඳ මිය ගිය ස්වාමියාම පතමින් ගෘහ දාසියක වශයෙනි. මෙම චාරිත්‍රය බ්‍රාහ්මණ ධර්මයන්හි දැක්වෙන්නේ.

i සති පූජාව වශයෙනි ii ගෘහීය චාරිත්‍ර වශයෙනි iii උපනයන චාරිත්‍ර වශයෙනි
iv පර්ධා චාරිත්‍ර වශයෙනි v ශ්‍රාද්ධ පූජාව වශයෙනි

06 බමුණන් විසින් විවිධාකාරයෙන් පීඩනයට ලක් කරනු ලැබූ කාන්තාවන්ට බුදුරජාණන් වහන්සේ විසින් ලෞකික බැඳීම් වලින් නිදහස්ව ලෝකෝත්තර සැප සාධනය කර ගැනීමට පවා අවස්ථාව උදා කර දී තිබුණි. ඒ බව මැනවින් ප්‍රකට කරන ක්‍රියාකාරකමක් වන්නේ.

i කාන්තාව මහා බ්‍රහ්මයාට උපමා කර වන්දනීයත්වයට පත් කිරීමෙනි
ii කාන්තාව දේවත්වයට උපමා කර පූජනීයත්වයට පත් කිරීමෙනි
iii කාන්තාවට භික්ෂුණියක් ලෙස කටයුතු කිරීමට අවස්ථාව සලසා දෙමිනි
iv කාන්තාවට පුරුෂයා හා සමාන අවස්ථා සමාජය තුළ සලසා දීමෙනි.
v කාන්තාව සති පූජාවෙන් නිදහස් කිරීමෙනි.

07 වර්ණ ධර්මයෙහි නිසරු බව බුදුරජාණන් වහන්සේ හේතුඵල වාදීව ප්‍රතික්ෂේප කරන ලදි. එහි ආචාර විද්‍යාත්මක සාධක ගෙනහැර දක්වන්නේ.

i වසල සූත්‍රයෙනි ii අස්සලායන සූත්‍රයෙනි iii අග්ගඤ්ඤ සූත්‍රයෙනි
iv වාසෙට්ඨ සූත්‍රයෙනි v පරාභව සූත්‍රයෙනි

08 බුදුරදුන් පහළ වනවිට ශ්‍රමණ චින්තනය තුළ විශාල අනු ගාමිකයන් පිරිසකට නායකත්වය ලබා දෙමින් කටයුතු කළ ආගමිකයන් අතර ෂට් ශාස්තෘවරුන් ප්‍රමුඛ වෙති. මොවුන් විසින් විවිධ දර්ශන ඉදිරිපත් කරන ලදි නමුත් ඔවුන් සියලු දෙනාම නොපිළිගත් ආගමික මතයක් වන්නේ

i සියලු මිනිස්සු මරණයෙන් උච්ඡේදයට පත්වන බවයි
ii සියලු දෙනා නියතියකට අනුව සසර ගමන් කරන බවයි
iii කිසිවෙකු කරන හොඳ හෝ නරක ක්‍රියාවකට විපාකයක් නැති බවයි
iv සියලු දෙනා සදාතනික පරමාණු පදාර්ත වලින් නිර්මාණය වී ඇති බවයි.
v සමාජයේ යහ පැවැත්මට කුල භේදය අත්‍යවශ්‍ය බවයි

09 ෂට් ශාස්තෘවරුන් අතරින් මක්ඛලීගෝසාල ශාස්තෘවරයාගේ ප්‍රධානතම ඉගැන්වීම වනුයේ

i ''සියල්ල සිදුවන්නේ කර්මය තුළින්'' යන්නයි
ii ''නියති පරිනාමයකින් විමුක්තිය ලැබේ'' යන්නයි
iii ''සප්තකාය පදාර්තයකින් සත්වයා හා ලෝකය නිර්මාණය වී ඇත'' යන්නයි
iv මරණින් මතු නැවත ඉපදීමක් නැති නිසා මරණය යනු මෝක්ෂය බවයි
v ආත්මය සදාකාලික වූවක් බවයි

10 නිගණ්ඨනාතපුත්ත ශාස්තෘතුමාගේ කර්ම විග්‍රහය තුළ කර්මය කොටස් අටකට බෙදා දක්වා තිබේ. එහි කොටස් අටට ඇතුලත් නොවන කර්මය වන්නේ.

i ඥානවර්ණීය කර්ම ii වේදනිය කර්ම iii ජනක කර්ම
iv ගෝත්‍ර කර්ම v මෝහනීය කර්ම

11 බුදුරජාණන් වහන්සේගේ ''චරථ භික්ඛවේ චාරිකං'' යනුවෙන් තම ප්‍රථම ධර්ම දූතයන් වහන්සේලා ආමන්ත්‍රණය කරමින් තමන් වහන්සේ අවබෝධ කරගත් ශ්‍රී සද්ධර්මය සමස්ත ලෝකවාසීන්ට ලබාදීමේ ඒ මහගු කාර්යය ආරම්භ කරන ලද්දේ.

i මගධ ජනපදයේ සිටය ii කෝසල ජනපදයේ සිටය iii වජ්ජී ජනපදයේ සිටය
iv අංග ජනපදයේ සිටය v කාසි ජනපදයේ සිටය

12 තමාගේ යහපත අයහපත සලසා ගැනීම සඳහා පුද්ගලයාට දී ඇති ස්වාධීනතාව බුදු දහම පිළිගනී. ඒ අනුව තම යහපත සඳහා පුද්ගලයෙකු තෝරාගතයුතු සුදුසුම මාර්ගය පහදා දෙන්නේ.

i පරාභව සූත්‍රය ii මහා මංගල සූත්‍රය iii ව්‍යග්ගපජ්ජ සූත්‍රය
iv සිගාලෝවාද සූත්‍රය v තමෝතම සූත්‍රය

13 සිල්වත්වූ පති භක්තියෙන් යුතු කාන්තාව බිහිකරන පුතණුවන් රාජ්‍යානුශාසනාවට පවා සුදුසුබව දැක්වෙන ප්‍රකාශය අඩංගු සූත්‍රය වන්නේ.

i සෝමා සූත්‍රයයි ii සිගාලෝවාද සූත්‍රයයි iii වසල සූත්‍රයයි
iv සප්තභරියා සූත්‍රයයි v ධීතු සූත්‍රයයි.

14 වත්ස්‍ය රාජ්‍යය සොලොස් මහා ජනපද අතරින් මහා රාජ්‍ය ගණයට අයත් වූවකි. මෙම රාජ්‍ය තුළ ද බුදු දහම ව්‍යාප්තව පැවති බවට තොරතුරු ශාසන ඉතිහාසය අධ්‍යනය කිරීම තුළින් වටහාගත හැකිය. එයට එක් සාධකයක් වන්නේ බුදුරදුන් මෙම රාජ්‍යය තුළ වස් වාසය කළ අවස්ථාවන් පවා වාර්තා වී තිබීමෙනි. බුදුරදුන් මෙහි වාසය කළ වකවානුවක ඇති වූ විශේෂ සිදුවීමක් වන්නේ.

i ධර්මධර විනයධර භික්ෂු ගැටුම ඇති වීම
ii අනේපිඩු සිටුතුමා ජේතවනාරාමය පූජා කිරීම
iii බුදුරජුන් විසින් අනන්ත ලක්ඛන සූත්‍රය දේශනා කිරීම
iv ශාක්‍ය කුමාරවරුන්ගේ පැවිද්ද සිදු වීම
v බුදුරජුන් විසින් වස්විසීම නිර්දේශ කිරීම

15 බුද්ධ කාලීන භාරතය තුළ දියුණු ආර්ථික ක්‍රමයක් පැවති බවට සාධක ත්‍රිපිටක සාහිත්‍යයෙන් පමණක් නොව ඉතිහාසඥයන්ගේ ලේඛන තුළින්ද පැහැදිලි වේ. ඒ අනුව දියුණු වාණිජ ආර්ථිකයක් පැවති බවට ඉදිරිපත් කළ හැකි කදිම සාධකය වන්නේ.

i ජනප්‍රියත්වයට පත් වෙළඳ වරායවල් - නගර සහ මාර්ග පැවතීම
ii දියුණු වෘත්තීය සමිති ක්‍රමයක් ක්‍රියාත්මක වීම
iii වෙළඳ කටයුතු සඳහා තවලම් හා ගැල් යොදා ගැනීම
iv විශාල ධනයකට හිමිකම් කියූ සිටුවර පන්තියක් බිහි වීම
v හුවමාරු මාධ්‍යයක් ලෙස කාසි භාවිතයට පැමිණීම

16 ''ලෝකයේ ප්‍රසිද්ධ ආගම් වලින් මා බුදුදහමට විශේෂයෙන් මුල් බුදුදහමට කැමති වන්නේ ඉන් කිසිවෙකු පීඩාවට පත් නොකරන බැවිනි'' බුදුරදුන් පිළිබඳව මෙසේ ආගයීමට ලක් කරනු ලැබුවේ.

i මහාචාර්ය සෝන්ඩර්ස් විසිනි
ii එඩ්වින් ආර්නෝල්ඩ් විසිනි
iii බර්ට්‍රන්ඩ් රසල් විසිනි
iv මහාචාර්ය මැක්ස් මුලර් විසිනි
v ආචාර්ය සර්ව පල්ලි රාධක්‍රිෂ්ණන් විසිනි

17 බුදුරජාණන් වහන්සේගේ චරිතය මෙන්ම උන් වහන්සේගේ ශ්‍රාවකයන් වහන්සේලාගේ චරිත වලින්ද වත්මන් සමාජයේ පුද්ගල චරිත හැඩ ගස්වා ගැනීමට ගත හැකි ආදර්ශ අපමණය. ඒ අනුව බුදුරදුන්ගේ දකුණත් සව් වූ සැරියුත් තෙරුන්ගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ සමූහයක් අතර සුවිශේෂී එක් ආදර්ශයක් වන්නේ.

i තම සුවිශේෂී සෘද්ධි බලය සත්වයාගේ ජීවිත සුවපත් කර ගැනීමට යොදා ගැනීම
ii තනතුරෙන් උඩඟු නොවී තම ගුරුවරුන්ට දිනපතා උපහාර දැක්වීමට යොමුවීම
iii දෛනික සත්පුරුෂ ඇසුරම ප්‍රාර්ථනා කිරීම
iv දිනපතා තෙරුවන් සරණ යාම
v තමන් උපමා කරගෙන කටයුතු කිරීමට යොමු වීම

18 ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව විශේෂ කුසලතා හා ගුණාංග පදනම් කරගෙන බුදුරජාණන් වහන්සේ තනතුරු ප්‍රදානය කළ අවස්ථා පිළිබඳ ඒතදග්ග පාලිය තුළින් හඳුනාගත හැකිය. ඒ අනුව නකුල මාතාවද තනතුරුලාභී උපාසිකාවකි ඇයට හිමි වූ ශාසනික තනතුර වූයේ.

i බහුශ්‍රැත උපාසිකාවන් අතරඅග්‍රස්ථානයයි.
ii මෛත්‍රී විහරණ උපාසිකාවන් අතර අග්‍ර ස්ථානයයි.
iii පළමුව සරණ උපාසිකාවන් අතර අග්‍රස්ථානයයි.
iv විශ්වාස කතා ඇති උපාසිකාවන් අතර අග්‍රස්ථානයයි
iii ගිලාන උපස්ථානයේ යෙදෙන උපාසිකාවන් අතර අග්‍රස්ථානයයි

19 පුද්ගලයාගේ ස්වාධීනත්වය, ස්වච්ඡන්දතාවය වගකීම ප්‍රකට කෙරෙන වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ.

i ''තමා උපමා කොට අනුන්ට හිංසා පීඩා නොකළ යුතුය'' යන්නයි

ii ''පව් කරන්නා දෙලොවම තැවෙයි'' යන්නයි

iii ''සරු දේ සරු ලෙසත් නිසරු දේ නිසරු ලෙසත් දැකිය යුතුය'' යන්නයි

iv චේතනාව කර්මය වේ යන්නයි

v ''තමා පිහිට තමාමය, අන්කිසි පිහිටක් නැත'' යන්නයි

20 පහත සඳහන් ශික්ෂා පද අතරින් උපෝසථ අෂ්ඨාංග ශීලයට අයත් වන්නේ

i පිසුනාවාචා වේරමණී සික්ඛා පදං සමාදියාමි යන්නයි

ii කාමේසුමිච්ඡාචාරා වේරමණී සික්ඛා පදං සමාදියාමි යන්නයි

iii නච්චගීත වාදිත විසූක දස්සනා වේරමනී වේරමණී සික්ඛා පදං සමාදියාමි යන්නයි

iv මුසාවාදා වේරමණී සික්ඛා පදං සමාදියාමි යන්නය

v මාලාගනධ විලේපන ධාරණ මණ්ඩන විභූස නට්ඨානා වේරමණී සික්ඛා පදං සමාදියාමි යන්නයි

21 සිගාල ගෘහපතිට බුදුන් වහන්සේ විසින් පහදා දුන් පරිදි සදිසා නමස්කාරයේ බටහිර දිසාව ලෙස හඳුන්වා ඇත්තේ.

i දෙමාපියන්ය ii ඇදුරුතුමන්ය iii මිතුරන්ය

iv අඹුදරුවන්ය v දැසි දසුන්ය

22 චතුර්විධ කර්ම ක්ලේෂ වලට අයත් නොවන්නේ

i ප්‍රාණඝාතය ii අදත්තාදානය iii කාමමිත්‍යාචාරය

iv මුසාවාදය v සුරාපානය

23 සිගාලෝවාද සූත්‍රයේ දක්වා ඇති පරිදි පුද්ගලයෙකු ගේ භෝග විනාශමුඛ ගණන වන්නේ

i 10 කි ii 24කි iii 6කි

iv 12කි v 8කි

24 මෙලොව පරලොව දියුණුව සලසා ගැනීම සඳහා බුදුන්වහන්සේ විසින් දෙවියන් වෙත දේශනා කල මංගල සූත්‍රය දේශනා කලේ

i වේලුවනාරාමයේදීය ii කුක්කුටාරාමයේදීය iii ජේතවනාරාමයේදීය

iv නිගෝධාරාමයේදීය v පාවාරික අඹ වනයේදීය

25 සුකාරානි අසාධුනි - අත්තනෝ අහිතානිච

යංවේ හිතංච සාධුංච - තංවේ පරම දුක්කාරං ඉහත ධම්මපද ගාථාවේ අදහස වන්නේ

i තමාගේ මෙන්ම මෙමාගේ යහපත උදෙසා කටයුතු කළ යුතු බවය.

ii යම්දෙයක් හිතවේද යහපත්වේද ඒ දෙය සිදුකිරීම ඉතාම අමාරු බවය.

iii තමාට මෙන්ම අනුන්ටද ධර්මය හැර පිහිටක් නොමැති බවය.

iv අනුන්ගේ පිහිට නොපතා තමාට තමාව පිහිට විය යුතු බවය.

v තමන් උපමා කොට අනුන්ට හිංසා නොකළ යුතු බවය.

26 ''සුතං පරියෝ ද පෙන්ති'' යන ගාථා පදයෙන් කියැවෙන්නේ.

i බොරු කියන්නා සත්‍ය කීමෙන් දිනන්නේය යන්නය

i කයෙන් සංවර වීම යහපත්ය යන්නය

iii ජීවිතයේ කළ යුත්ත නොකළ යුත්ත පෙන්වාදීම යන්නය

iv ඇසූ දේ තව දුරටත් ප්‍රගුණ කිරීම යන්නය

v විමසා බලා කටයුතු කිරීම යන්නය.

27 ''වහන්ස දැන් වෘක්ෂයේ ගිනි අගුරු වැනි රතු පැහැති මල් දලු ඇත්තේ පරණ කොළ වැටී පලදරන කාලයට පැමිණියෝ වෙත් ..... භගී රට පරම්පාරවෙහි වුවනට අනුග්‍රහ පිණිස වඩින්නට දැන් කාලය වේ. මෙම ප්‍රකාශය කළේ

i පුණ්ණ හිමි ii කොණ්ඩඤ්ඤ හිමි iii කාලුදායි හිමි

iv ආනන්ද හිමි v මහාකාශ්‍යප හිමි

28 භාරතයේ බොහෝ සෙයින් වාසය කලේ අන්‍යාගමිකයන්ය. බ්‍රාහ්මණ ආගමිකයින් ජෛන දාර්ශනිකයින් සමග මතවාද වල ගැටෙමින් ඔවුන්ගේ මත ඛණ්ඩනය කළ යුතු විය. එවැනි දාර්ශනිකයින් සමඟ වාද විවාද කරමින් ශාසනය වෙනුවෙන් උදාර සේවාවක් ඉටු කළ මහ රහතන් වහන්සේ නමකි පිණ්ඩෝල භාරද්වාජ තෙරණුවෝ. බුද්ධ ශාසනයේ උන්වහන්සේට හිමි වූ තනතුර වූයේ.

i නිරෝගිමත් භික්ෂූන් අතර අග තනතුර ii වීර්යවන්ත භික්ෂූන් අතර අග තනතුර

iii දක්ෂ කථික භික්ෂූන් අතර අග තනතුර iv විනයධර භික්ෂූන් අතර අග තනතුර

v මිහිරි කටහඬක් ඇති භික්ෂූන් අතර අග තනතුර

29 දෙවන ධර්ම සංඝායනාවට හේතු සාධකය වූ දස අකැප වස්තුවෙහි ''ජලෝගි පාතුං කප්ප'' යනුවෙන් අදහස් කරන ලද්දේ.

i නොපැසුණු සුරා පානය කැපය i කිරිත් නොවූ දී කිරිත් නොවූ කිරි පරිභෝජනය කැපය

iii රන් රිදී මසු කහවණු පිළිගැනීම කැපය iv පසුව අනුමැතිය ගැනීමේ අටියෙන් සංඝ කර්ම කැපය

v අඟක ලුණු තබාගෙන ආහාරවල මිශ්‍රකර වැළඳීම කැපය.

30 පරවාද 500 ක් ඛන්ඩනය කර සකවාද 500 ක් ඇතුළත්කර රචනා වූ ග්‍රන්ථය වූයේ.

i චුල්ලවග්ග පාලියයි i කථාවත්ථුපකරණයයි iii සේරිස්සක විමානවත්තුව

iv පේත වත්තුව v උත්තරාමාතු පේත වත්ථුව

31 තෙවන ධර්ම සංඝායනාවේ විශිෂ්ඨම ප්‍රතිඵලය වන්නේ භාරතයෙන් පිටරටවල් 09 කට දහම් ප්‍රචාරය කරවීමයි. ඒ සඳහා සැලසුම් සහගතව ධර්මදූත කණ්ඩායම් 09 ක් සකස්කරන ලදි. ඒ අනුව ''අපරන්තය දේශය''ට ධර්ම දූත හිමියන් ලෙස කටයුතු කළේ.

i මහා ධම්මරක්ඛිත හිමි i මජ්ජිම තෙර iii සෝණක ධම්ම රක්ඛිත තෙර

iv රක්ඛිත තෙර v මජ්ඣන්තික තෙර

32 අශෝක ධර්මයට අනුව ''දෙමව්පියන්ට සැළකිය යුතුය. ඥාතීන්ට සැලකිය යුතුය, දන් දිය යුතුය'' යන ඉගැන්වීමට සමාන ඉගැන්වීමක් ඉදිරිපත් කරන සූත්‍ර දේශනාව ලෙස සැලකිය හැක්කේ.

i සිඟාලෝවාද සූත්‍රයයි i මංගල සූත්‍රයයි iii පරාභව සූත්‍රයයි

iv වසල සූත්‍රයයි v ව්‍යග්ගපජ්ජ සූත්‍රයයි

33 ථේරවාදට මෙන්ම වෙනත් බෞද්ධ සම්ප්‍රදායයන්ගේ පැවැත්ම අභිවෘද්ධිය හා ව්‍යාප්තිය වෙනුවෙන් භාරතීය බෞද්ධ පාලකයන්ගෙන් සිදුවූ මෙහෙය අතිවිශාලය. භාරතීය සාසන ඉතිහාසයේ කුෂාණ යුගය මෙහිලා සන්ධිස්ථානයක් වශයෙන් සැලකිය හැකිය. කනිෂ්ක රජතුමා බුදු සමය වැළඳ ගැනීමෙන් අනතුරුව බුදුසමයේ උන්නතිය වෙනුවෙන් මෙතුමා කළ ප්‍රමුඛ කාර්යයක් වන්නේ.

i දුසිල් මහණුන් සසුනෙන් නෙරපා ශාසනය පිරිසිදු කිරීමය

i ථෙරවාදී බුදු සමය දේශාන්තරයන්හි ව්‍යාප්ත කිරීමය

iii විසිරි පැවති ථෙරවාදී ධර්මය ඒකරාශී කිරීමය

iv ථෙරවාදී සංගීතියක් පැවැත්වීමට අනුග්‍රහ කිරීමය

v ධර්මය තඹ තහඩු වල ලියා තැන්පත් කිරීමය

34 අධ්‍යාපන හා පර්යේෂණ සඳහා ප්‍රකට වූ කීර්තිමත් විශ්ව විද්‍යාල ගණනාවක් භාරතයේ පැවතුනි. මෙම විශ්ව විද්‍යාල වලින් බොහෝමයක් මහායාන බෞද්ධ ඉගැන්වීම් වලට මූලිකත්වය දුන් මහායාන විශ්ව විද්‍යාල ලෙස ප්‍රකටව පැවති අතර එක් පැරණි බෞද්ධ විශ්ව විද්‍යාලයක් මහායාන නොවන බෞද්ධ නිකාය වලට අයත් ආයතනයක් ලෙස පැවතුනි. එම අධ්‍යාපන ආයතනය වූයේ.

i නාලන්දා විශ්ව විද්‍යාලයයි i වලභි විශ්ව විද්‍යාලයය i

i ජගද්දල විශ්ව විද්‍යාලයය iv වික්‍රමශිලා විශ්ව විද්‍යාලයය

v ඕදන්තපුරි විශ්ව විද්‍යාලයය

35 ප්‍රාග් බෞද්ධ යුගයේදී ශ්‍රී ලංකාවේ ඇදහිලි හා විශ්වාස රාශියක් පැවතුණි. මේ අතර ජෛනාගම මෙරට ව්‍යාප්තව පැවතුණි. මේ අතර ජෛනාගම මෙරට ව්‍යාප්තව පැවති බවට සාක්ෂියක් ලෙසින් ඇතැම් ජෛන සාධුවරුන් උදෙසා පණ්ඩුකාභය රජු ආරාම ඉදි කරදීම පෙන්වා දිය හැකිය. එවැනි එක් ජෛනාගමික සාධුවරයෙක් වූයේ

i ව්‍යාධ දේවයාය i ජුතින්ද්‍රය iii කුම්භාණ්ඩය

iv මනේජය v වෛශ්‍රවණය

36 ශ්‍රී ලංකාවට බුදු දහම ලබීමත් සමග බුදු සසුනෙහි සංවර්ධනයක් ඇතිවිය. ඉසුරුමුණි විහාරය, නාගදීපය, ජම්බුකෝළ විහාරය, තිස්සමහාරාම විහාරය, ප්‍රාචීනාරාමය, භික්ෂුනීන් සඳහා හත්තාළහක මෙහෙණවර ආදී වෙහෙරවිහාර ඉදිකළ රජතුමා වූයේ.

i දුටුගැමුණු රජු i වළගම්බා රජු iii දෙවන පෑතිස් රජු

iv මුටසීව රජු v මහසෙන් රජු

37 මහසෙන් රජ දවස දක්ෂිණ ගිරියෙහි පැවති සම්ප්‍රදාය වූයේ.

i ථේරවාදී සම්ප්‍රදායකි i ධර්මරුචි සම්ප්‍රදායකි iii සාගලික සම්ප්‍රදායකි

iv මොහ් සම්ප්‍රදායකි v සෙන් සම්ප්‍රදායකි

38 බුදුරදුන්ගේ පාත්‍රා ධාතුව හා සිවුරක් චීනයට රැගෙන යාම සුවිශේෂී සිදුවීමකි. මහා කාශ්‍යප තෙරුන්වහන්සේගේ පෙළපතට අයත් එම භික්ෂුව.

i චූපාලන් නම් භික්ෂුවයි i කුමාරජීව නම් භික්ෂුවයි iii ධර්ම නම් භික්ෂුවයි

iv තාඕ ආන්නම් භික්ෂුවයි v බෝධි ධර්ම නම් භික්ෂුවයි

39 බුදුරජාණන් වහන්සේගේ පිරිනිවන් පෑම සිහිකරමින් පෙබරවාරි 15 දින උත්සවය සමරති. ජපන් ජනතාව විහාරස්ථානයට රැස්වී පවත්වන මෙය හඳුන්වන්නේ.

i බොන් යන්නයි  i නෙහන් ඒ සෙන්ය  iii හරිසෙන්සුයි යන්නයි

iv චානෝධ් යන්නයි  v සෙන්සුබුන් යන්නයි

40 මථුරා බුදු පිළිමයේ දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ ලෙස දැක්විය හැක්කේ

i ශාක්‍යසිංහ ලීලාව, විවෘතනෙත්, ස්වාභාවික හිස කෙස්ය

i ශාක්‍යසිංහ ලීලාව, විවෘතනෙත්, කැරලි ගැසුණු හිසකෙස්

iii ශාක්‍යසිංහ ලීලාව, අඩවන් නෙත්, කැරලි ගැසුණු හිසකෙස්

iv ශාක්‍යසිංහ ලීලාව, අඩවන් නෙත්, කැරලි ගැසුණු හිසකෙස්

v ශාක්‍යසිංහ ලීලාව, මන්දස්මිතය,ස්වාභවික හිස හිසකෙස්

41 ගන්ධ කුටී, ගෙඩිගේ, ප්‍රසාද යන ක්‍රම තුනක් දක්නට ලැබෙන කලා නිර්මාණය වනුයේ.

i බෝධිඝරයෙහි  ii චේතිය ඝරයෙහි  ii පටිමා ඝරයයි

iv කොරවක්ගලයි  v මුරගලය

42 අර්ධ කවාකාර හැඩයෙන් නෙලාඇති සඳකඩ පහණ අපේ පැරණි කලා ශිල්පියාගේ නිපුණත්වය කියාපාන්නකි මෙහි විවිධ අදහස් මතුකර දැක්වූ පරණාවිතාන ශූරීන්ට අනුව සත්ත්ව රූප හතර මගින් නිරූපනය වන්නේ.

i තෘෂ්ණාවයි  i ජාති, ජරා, ව්‍යාධි, මරණ

ii තෘෂ්ණාවෙන් වෙලී සිටින සත්වයාය  iv ශාන්තිය සොයා යන ගමනය

v නිවනය

43 හිඳි පිළිම යනු වාඩිවී සින ඉරියව්වෙන් නෙළා ඇති බුද්ධ ප්‍රතිමාය.විවිධ මුද්‍රා දක්වමින් හිඳි පිළිම නිමවා ඇති අතර ලංකාවේ පැරණිම හිඳි පිළිමයක් වන්නේ.

i අවුකන පිළිමය  i අනුරාධපුර සමාධි පිළිමය  i බුත්තල පිළිමයයි

iv තන්තිරිමලේ පිළිමයයි  v කිරිබත්වෙහෙර පිළිමයයි

44 බුද්ධ ප්‍රතිමාවේ දක්නට ඇති ධර්මචක්‍ර මුද්‍රාව බුදුන් වහන්සේගේ ධර්ම දේශනාවිලාශය සංකේතවත් කරයි. දකුණු අත්ල පිටතට හරවා පපුවේ මට්ටමට තබාගෙන එහි දබර ඇඟිල්ලේ හා මාපට ඇඟිල්ලේ තුඩු දෙක කවයක් සෑදෙන සේ එකට තබා ඇතුළට හැරුණු වම් අතේ ඇඟිල්ලක් ස්පර්ශ කරන අයුරින් පැවතීමයි. මෙලෙස නිමවූ පැරණිම බුද්ධ ප්‍රතිමාව වනුයේ.

i මැදිරිගිරියේ සමාධි පිළිමය  i දඹුලු විහාරයේ සමාධි ප්‍රතිමාව

i මහඉලුප්පල්ලම පිළිමය  iv සාරානාත් බුද්ධ ප්‍රතිමාව

v වැවුරුකන්නල සමාධි පිළිමය

45 එළදෙනක ඇණ මරණයට පත් කළ හිමි නමකගේ දේහය දවා ස්ථූපයක් ඉදිකරන ලෙස බුදුන් වහන්සේ දැක්වූ එම හිමිනම වනුයේ.

i පිණ්ඩෝල භාරද්වාජ හිමියන්ය  i මුගලන් හිමියන්ය

iii සැරියුත් හිමියන්ය  iv දාරුචීරිය බාහිය හිමියන්ය

v බක්කුල හිමියන්ය

46 චෛත්‍යයේ කොටස් අතර ''හතරැස් කොටුවෙන්'' සංකේතවත් කර ඇත්තේ

i සත්තිස් බෝධිපාක්ෂික ධර්ම    i දිව්‍යලෝකය

iii නිර්වාණය    iv චතුරාර්ය සත්‍යයි

v නවාංග ශාස්තෘ ශාසනය

47 සිතුවම් ලොවේ අභිෂේක ලත් සීගිරි අප්සරාවෝ පිරිපුන් කුසලතාවයෙන් යුතු සිතුවම් කරුවෙකුගේ තෙලි තුඩින් ජීවය ලද්දේය. සීගිරි ලියන් මත තැවරූ සායම් ඉවත්කිරීමට කටයුතු කලේ.

i පරණවිතාන මහතාය    ii රඝවාන් මහතාය    i බෙල් මහතාය

iv ආනන්ද කුමාරස්වාමි මහතාය    v ලුසියිනෝ මරාන්සි

48 භාරතීය අලංකාර ශාස්ත්‍රය පදනම් කරගෙන නිර්මාණය වූ සිංහලයේ විශිෂ්ඨතම මහා කාව්‍ය කව් සිළුමිණයි. මෙම කෘතිය රචනා කරන ලද්දේ.

i ගුරුළුගෝමීන්ය    i විද්‍යාචක්‍රවර්තින්ය    i 2 වන මහා පරාක්‍රමබාහු රජුය

iv ධර්මසේන හිමියන්ය    v බුද්ධපුත්‍ර හිමියන්ය

49 සිංහල සාහිත්‍ය ගැන කියවෙන ඕනෑම අවස්ථාවක කිසිවෙකුට අමතක නොවන නාමයකි තොටගමුවේ ෂට් භාෂා පරමේෂ්වර ශ්‍රී රාහුල හිමියන් ත්‍රිපිටකය ගැන මැනවින් හදාළ ශ්‍රේෂ්ඨ පඬිරුවනකි. උන් වහන්සේ විසින් රචිත ග්‍රන්ථයක් නොවන්නේ.

i පංචිකා ප්‍රදීපය    i දහම් ගැට මාලාව    i ගුත්තිල කාව්‍යය

iv ලෝවැඩ සඟරාව    v එළුසිලෝශතකය

50 ඈත අතීතයේ පමණක් නොව වර්තමානයේ පවා ලාංකික ජන සමාජයේ කලා රසාස්වාදය පිණිස සිදුකරනු ලබන බොහෝ නිර්මාණයන්ගේ දැකිය හැක්කේ බෞද්ධාභාසයයි. ඒ අනුව වර්තමාන සමාජයේ ද ඉතා ඉහළ ප්‍රතිචාර ලැබේ. මෙයට හොඳම උදාහරණය මහාචාරය සරච්චන්ද්‍රයන්ගේ මනමේ නාට්‍යයයි. මෙම නිර්මාණයට පාදක වූ ජාතක කතාව වූයේ.

i සේරිවාණිජ ජාතකයයි    i උම්මග්ග ජාතකයයි    i ලෝමහංස ජාතකයයි

iv කුස ජාතකයයි    v චුල්ල ධනුද්දර ජාතකයයි